සභාවේ ගෞරවය සහ සාන්තුවරය

ශුද්ධවූ සභාව 21 වන සියවසේ ස්ථීර විශ්වාසයේ සාන්තුවරයා ලෙස එතුමන් නිල වශයෙන් පිළිගැනීමට කටයුතු ආරම්භ විය. 2012 දෙසැම්බර් 2 වන දින, ශුද්ධෝත්තම බෙනඩික්ට් පාප්තුමන් විසින් කොට්ටාර් පදවියේ දී මෙතුමන් භාග්‍යවරයෙක් ලෙස ප්‍රකාශ කරන ලදි. 2020 පෙබරවාරි 21වන දින, එතුමා ශුද්ධ වූ සභාවේ ප්‍රාණ පරිත්‍යාගීවරයෙක් ලෙස නිල වශයෙන් නම් කිරීමට වතිකානය විසින් ක්‍රියාකළා. 2022 මැයි 15 වන දින, ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප්තුමන් විසින් රෝමයේදී ශුද්ධ වූ දේවසහායම් ලෙස ශුද්ධවරයට ඔසවන ලදි. 2025 සැප්තැම්බර් 20 වන දින, රෝමයේදී ඔහු ඉන්දියාවේ ගිහි විශ්වාසිකයින්ගේ ආරක්ෂක සාන්තුවරයා ලෙස නිල වශයෙන් ප්‍රකාශ කළේය. 2026 ජනවාරි 14 වන දින, දේවසහායම් කන්ද නමින් ජාතික සිද්ධස්ථානයක් ඉදිකළ අතර, ඉන්දියාවේ අපොස්තලික තානාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් එය සභාවේ ජාතික මට්ටමේ ගෞරවයට උසස් කරන ලදී.

දේවසහායම් කන්ද - ජාතික පුදබිම

ප්‍රාණපරිත්‍යාගී ශුද්ධවූ දේවසහායම් මුනිඳුන්ගේ වන්දනා ස්ථානය වන දේවසහායම් කන්ද දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රදේශයේ අද සුප්‍රසිද්ධ



වන්දනා ස්ථානයක් වී ඇත. ආරම්භයේදී සරල ප්‍රාණපරිත්‍යාගීවරයාගේ ප්‍රදර්ශන ස්ථානයක් වූ මෙය, අද වික්ෂෝප දේව මාතාවන්ගේ සහ ශුද්ධවූ දේවසහායම් මුනිතුමාගේ පුද බිම ලෙස ජනප්‍රිය වී, සෑම වසරකම දහස් ගණනින් වන්දනාකරුවන් වැඳුම් පැදුම් කරන ස්ථානයක් බවට පත් වී ඇත.

විවිධ ප්‍රදේශවලින් සහ ආගම්වලින් පැමිණෙන ජනතාව මෙහිදී සුවය, සැනසීම සහ අධ්‍යාත්මික සුවය සොයා එයි. මෙම සිද්ධස්ථානය වික්ෂෝප දේවමාතාවන්ගේ හා ප්‍රාණපරිත්‍යාගී ශුද්ධවූ දේවසහායම්ගේ පිහිට ඒකාබද්ධව ලැබෙන ස්ථානයක් ලෙස පිළිගැනේ. සීඝ්‍රයෙන් වර්ධනය වන වන්දනාකරුවන්ගේ ගෞරවය සමඟම, මෙම පූදබිම අන්තර්ජාතික පූදබිමක් බවට පත් කිරීමට ශුද්ධ වූ සභාව කටයුතු කරයි.

ශුද්ධ වූ දේවසහායම් අධ්‍යාත්මික ව්‍යාපාරය

ශුද්ධ වූ දේවසහායම් මුනිඳුන්ගේ ජීවිතාදර්ශයෙන් ප්‍රමුදිත වී, ශ්‍ර. දේවසහායම් අධ්‍යාත්මික ව්‍යාපාරය ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපාරය මඟින් සභාව තුළ සහ සමාජය තුළ දේවසහායම් මුනිතුමන්ගේ අධ්‍යාත්මික පණිවිඩය ප්‍රචාරය කිරීම අරමුණු කෙරේ.
මෙම ව්‍යාපාරයේ මූලික අරමුණු:
1. දුක් විඳීම තුළ නොසැලෙන විශ්වාසය
2. සාමානාත්මතාවය සහ මනුෂ්‍ය අභිමානය
3. සත්‍යයට සහ විශ්වාසයට සාක්ෂි දැරීමට ඇති ධෛර්යය
4. සාධාරණය සහ ඒකත්වය සඳහා කැපවීම

වර්තමාන අධ්‍යක්ෂක ගරු. ලියොන් හෙන්සන් පියතුමාගේ නායකත්වයෙන්, මෙම ව්‍යාපාරය හරහා දේවසහායම් මුනිඳුන්ගේ අධ්‍යාත්මය ඊළඟ පරපුරටත්, රටේ අනෙකුත් පදවිවලටත් අනෙකුත් රටවලටත් ප්‍රචාරය කිරීම බලාපොරොත්තු වෙයි. එතුමාගේ දිවැසි පණිවුඩය අද ලෝකයේ කාලීන සලකුණු වලට අභියෝග කරමින්, සභාව තුළ සහ සමාජය තුළ නව අධ්‍යාත්මික ගමනකට ආරාධනා කරයි.



ශුද්ධවූ දේවසහායම්ගේ ප්‍රාතිහාර්ය්‍යාත්මක මධ්‍යස්ථවීම්


ප්‍රාණපරිත්‍යාගී ශුද්ධවර දේවසහායම් මුනිතුමා, නිර්භයව දේව වචනය උදෙසා තම රුධිරය හෙලමින් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත් ජීවමාන වැඩසිටීම වර්තමාන සමාජයට සාක්ෂියක් වන්නේය. එතුමන්ගේ ප්‍රාණ පරිත්‍යාගය හුදෙක් මරණයෙන් අවසන් වූවක් නොව, වර්තමානයේ විශ්වාසකයින්ගේ ජීවිත තවදුරටත් ස්පර්ශ කරන ගැඹුරු අධ්‍යාත්මික දායාදයක ආරම්භය විය. එතුමන්ගේ බලගතු මැදිහත්වීම දේව වරප්‍රසාදය ප්‍රථාපවත්ව අප අතර ප්‍රත්‍යක්ෂ වන මාධ්‍යයක්ම විය. බිහිරි අය ජීවනයේ රස ගීතය අසයි, අන්ධ අය මැවීමේ මනහර බව දකී, කොර අය නවමු ජවයකින් ඇවිද යයි.

අනේක විධ බැතිමතුන් එතුමන් වෙත යදින යාච්ඤාවේ ප්‍රාතිහාර්ය්‍යමය පිළිතුරු වලට සාක්ෂි දැරූහ. ශාරීරික සුවය පමණක් නොව, බොහෝ පවුල් තුළ ඇතුලාන්ත සාමය අත්දැකීම, ජීවිතයේ අරමුණු නොමැතිව විනාශය කරා යන අවස්ථාවේදී ප්‍රාතිහාර්ය්‍යාත්මකව ගැඹුරු අර්ථයක් සහ අරමුණක් සොයා ගත් බොහෝ දෙනා සාක්ෂි දරයි.

මෙම පුද බිම වන්දනා කරන්නට පැමිණ, අප මුනිතුමන්ගේ කරුණාව යදින්නට ඔබ සියලු දෙනාට ආරාධනා කරමු.

ශුද්ධ දේවසහායම් කන්ද පූදබිම
අරල්වයිමොළි, කන්‍යාකුමාරි දිස්ත්‍රික්කය, තමිල්නාඩු, ඉන්දියාව
දුරකථන: +919445946514
ඊමේල්: st.devasahayamshrine@gmail.com
වෙබ් අඩවිය: www.devasahayammountshrine.com

ශුද්ධවූ දේවසහායම් මුනිතුමා



ඉන්දියාවේ ප්‍රථම ගිහි සාන්තුවරයා

ඉන්දියාවේ පළමු ගිහි සාන්තුවරයා (1712 - 1752) ලෙස නම් කරන දේවසහායම් මුනිතුමා, ඉන්දියාවේ සහ මුළු මහත් විශ්වීය සභාවේ විශ්වාසයේ සාක්ෂිකරුවෙක් ලෙස පිළිගැනේ.

දකුණු ඉන්දියාවේ ඉතා දරුණු කුල පංති භේද සහ සමාජ අසමානතා පැවති යුගයක උපත ලද එතුමා, නිර්භීත ක්‍රිස්තු අනුගාමියෙක් ව අවසානයේදී ප්‍රාණපරිත්‍යාගීවරයෙකු විය.

ශුද්ධ වූ කතෝලික සභාව විසින් ශුද්ධවරයට එසවූ පළමු ගිහි සාන්තුවරයා වූ එතුමා තම විශ්වාසය තුළ පදනම් වූ, නිහතමානිකම තුළින් සහ සාධාරණත්වයෙන්, ඉන්දියාවේ පවතින සමාජ ව්‍යුහයනට අභියෝග කළා.

ශ්‍ර. දේවසහායම් මුනිතුමාගේ විශ්වාසයේ ජීවිතය, වර්තමාන ලෝකයට ආදර්ශයක් ගෙන දෙයි. ජාති, පන්ති සහ ආර්ථික තත්ත්ව මතභේද ව සිටින යුගයක, ඔහුගේ ජීවිතය අපට මතක් කර දෙන්නේ සත්‍ය විශ්වාසය සමානත්වය, ධෛර්යය සහ කරුණාව වෙත මඟ පෙන්වන බවයි.

එතුමා අතීතයේ සාන්තුවරයෙක් පමණක් නොව, වර්තමානයට ද මඟපෙන්වන්නෙකි. සෑම ජනවර්ගයකටම සම්පූර්ණත්වය, විශ්වාසය හා ප්‍රේමය පෙරදැරි කරගෙන ජීවත් වීමට ආරාධනා කරන්නෙකි.



ජීවිත කථාව සහ සිත් හැරීම

දේවසහායම්තුමා නීලකන්දන් නමින් 1712 අප්‍රේල් 23 වන දින දකුණු ඉන්දියාවේ වයනාඩ් රාජධානියට අයත් නට්ටාලම් ගම්මානයේ උපත ලැබීය. ඔහුගේ පියා වාසුදේවන් නම්බූදිරි, තිරුවට්ටාර් නගරයේ ආදිකේෂව පෙරුමාල් කෝවිලේ පූජකයෙක් වූ අතර, මව දේවාකි අම්මා ය. උසස් වෙළඳ කුලයකට දාව උපන් නීලකන්දන් අධ්‍යාපනයෙන්, විනයෙන් සහ සමාජ ප්‍රසාදය සමඟ වර්ධනය විය. ඔහු භාර්ගවි අම්මාල් සමග විවාහ වූ අතර පසුකාලීනව ඇයද ඥානාපූ අම්මාල් නමින් කතෝලික විශ්වාසය වැළඳ ගත්තාය. ඔහුගේ දක්ෂතාවය නිසා මාර්තාන්ඩ වර්මා රජුගේ රාජ්‍ය අධිකරණයේ සේවය කිරීමටත්, රාජකීය භාණ්ඩාගාරය, රාජ්‍ය ගොඩනැගිලි පරිපාලනය සහ තුවන්කෝර් හමුදාවේ අණදීම වැනි පරිපාලන කටයුතු ඔහු අතට පත්විය.



1741 කෝලචෙල් යුද්ධය ඔහුගේ ජීවිත පරිවර්තනයට හේතු විය. ලන්දේසි නාවික කපිතාන් යුස්ටේෂියස් ඩි ලෙනෝයි අල්ලාගත් අතර පසුව තුවන්කෝර් හමුදාවට බඳවා ගන්නා ලදී. මේ කාලයේ දී අධික දේපළ අහිමිවීම් නිසා බිඳ වැටුණු ඔහුගේ සමාජ ප්‍රසාදය හේතුවෙන් නීලකන්දන්ගේ ජීවිතයේ දැඩි පුද්ගලික අර්බුදයකට ඔහු මුහුණදෙන්නට පටන් ගත්තේය. මෙම අර්බුදයෙන් නිදහස් වීමට විවිධ දෙවිවරු පසුපස ගොස් ඔහු පිළිතුරු සොයන්නට පටන් ගත්තේය. එනමුත් ඔහුට කිසිඳු සැනසුමක් ලැබුනේ නැත. දෙවියන් විසින් තමන්ට දඬුවම් කරන බව හැඟුණ නමුත් ඔහුගේ දුක් විඳීමට හේතුව කුමක්දැයි තේරුම් ගත නොහැකි විය.

මේ අවස්ථාවේ දී කපිතාන් ලැනෝයි සමග ඇති වූ මිත්‍රත්වය හේතුවෙන් ඔහු ක්‍රිස්තියානි විශ්වාසය හඳුනා ගත්තේය. කපිතාන් ලැනෝයි ශුද්ධවූ ලියවිල්ලේ ඇති මනුශ්‍ය දුක් කරදර මධ්‍යයේ නොසැලෙන විශ්වාසයක් තැබූ ජෝබ්ගේ කථාව ඔහුට පහදා දුන්නේය. මේ හමුවීම තුළින් නීලකන්දන් දුක් කරදර පිළිබඳව නව අවබෝධයක් ලබා ගත්තා පමණක් නොව ජෝබ් තම දුක්කරදර මධ්‍යයේ දෙවියන් වහන්සේ කෙරෙහි තැබූ ස්ථිර විශ්වාසය ඔහුගේ සිත ගැඹුරින් ස්පර්ශ කළේය.

නම මසක් පුරා අභ්‍යන්තර අධ්‍යාත්මික අරගලයකට මුහුණ දුන් පසුව, නීලකන්දන් 1745 මැයි 14 වන දින වඩාකංකුලම්හී ශූ. පවුලේ



දේවස්ථානයේ දී ගරු. පියෝවන්නි බතිස්තා බුතාරි පූජාප්‍රසාදීන් වහන්සේ විසින් බෞතීස්ම ස්නානය ලබන ලදී. ඔහුට "දේවසහායම්" යන ක්‍රිස්තියානි නම දෙන ලදී. එහි අර්ථය නම් මාගේ සරණය දෙවියන් වහන්සේය යනුයි. ගරු. තෝමස් ද ෆොන්සේකා පියතුමා හට තම පළමු පාපෝච්චාරණය කළ පසු ඔහු පළමු වරට එතුමා අතින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත් අතර උයදගිරි දේවස්ථානයේ ලෙනෝයි සමග එක්ව දිව්‍ය පූජාවට සහභාගී විය.

ජීවිත සිත් හැරීමෙන් පසු, දේවසහායම් කුල භේද මගින් සිදුවන වෙනස්කම් ප්‍රතික්ෂේප කළ අතර දුගී අත්හල ජනතාව සමග සුහදව ඇසුරු කරන්නට පටන් ගත්හ. කරුණාව සහ යාච්ඤාව ප්‍රගුණ කරගත් ඔහු දේව වචනයට සාක්ෂි දැරීම තම ජීවිතයම කරගත්හ. තවද තම රාජ්‍ය සීමාව තුළ කිතුණු සංඝ 50 කට අධික සංඛ්‍යාවක පුරෝගාමියා වීමට ඔහු සමත් විය.

එහෙත් ඔහුගේ සිත් හැරීම නින්දු පූජකයින් අතර, රාජකීය නිලධාරීන් අතර සහ තුවන්කෝර් රජ පවුල තුළ දැඩි ආන්දෝලනයක් ඇති කළේය. උසස් කුලයක සිටි අයෙක් හින්දු ආගම අත්හැරීම, දැඩි අපරාධයක් ලෙස සඳහා ඔහුට විරුද්ධව චෝදනා ගොනු කර, අවුරුදු තුනක් සිරගත කරන ලදී.

දුක්විඳීම, ප්‍රාණ පරිත්‍යාග වීම සහ විජයග්‍රහණය



1749 දී, දේවසහායම් ට දේව අපහාස කිරීම යන චෝදනාව ඉදිරිපත් කර රාජ්‍ය තනතුරු වලින් ඉවත් කරන ලදී. එයින් පසු ඔහුට දැඩි වද හිංසාවලට මුහුණ දීමට සිදුවිය. ශාරීරික පීඩා, සමාජය ඉදිරියේ අපහාස සහ මානසික පීඩා ඔහු කම්පාවට ලක් කළහ.

ඔහුව ගම් විදිවල අපහාස කරමින් ඇදගෙන ගොස් තලා පෙලා, මරණ



තර්ජනය කර, පොදු ස්ථානවල අපහාසයට පත් කළහ. අභියෝග හා තර්ජන මධ්‍යයේ ඔහු තම විශ්වාසය කිසිවිටෙක පාවා නොදුන්නේය. ක්‍රිස්තුස්වහන්සේ අත්හැර දැමීමට ලද නියෝග නොසළකා, ධෛර්යමත්ව නොකඩවා යාච්ඤා කළේය. තවද ඔහු තම පීඩාකරුවන්ට සමාව දුන් අතර, සෙසු අනුගාමික විශ්වාසිකයින්ව ද ධෛර්යමත්ව යාච්ඤාවෙන් සිටීමට උනන්දු කරවිය. ඔහු තම දුක්විඳීම පෞද්ගලික වේදනාවක් සේ නොසළකා විශ්වාසයට බලගතු සාක්ෂි දැරීමක් සේ සැළකුවේය. කුල භේදවලින් පිරිහී ඇති සමාජයට දෙවියන් වහන්සේ ඉදිරියේ සියළුදෙනා සමාන බව ඔහු තම ජීවිතාදර්ශයෙන් දේශනා කළේය. ඔහු තුළ ඇති ආත්ම ශක්තිය කිතුණු සභාවේ සෑමදෙනාට ආදර්ශයක් හා ධෛර්යයක් විය.

1751 අවසාන භාගයේ දී ඔහු අරල්වයිමොෂි හී පිහිටි කට්ටාඩිමලෙයි හි සිරගත කර තබන ලදී. 1752 ජනවාරි 14වන දින ඔහුව මරණීය දණ්ඩනය සඳහා ගෙන ගියහ. ඔහුගේ අවසන් යාච්ඤාව වූයේ, "අහෝ ජේසුනී, මා අත් නොහරිය මැනව! සදාසරණ මරි මවුනී මට සහය වුව මැනව! ස්වාමීනි, මගේ ආත්මය ඔබගේ හස්තයට භාර කරමි." යනුයි.

මෙසමයේ දී ඔහු උස් පර්වතයක හිඳ යාච්ඤා කරමින් සිටි මොහොතේ අමානුෂික ලෙස ඔහුව වෙඩිතබා මරා දමන ලදී. ඔහුගේ අවසන් මොහොතේ දෙවියන්ට තම ජීවිතය භාරදීම සහ ඔහුට මරණ දණ්ඩනය දුන් අයට සමාව දීම ඔහු කළ ධර්මිෂ්ට ක්‍රියාවක් විය. ඔහුගේ මරණය තම ප්‍රාණ පරිත්‍යාගයේ මාර්ගය ද, එතුමන්ගෙන් ලද ආදර්ශය ක්‍රිස්තියානීන්ගේ සීඝ්‍ර වර්ධනයට හා පදනම් වීමට රුකුලක් විය.

ඔහුගේ ස්වර්ගස්ථවීමෙන් පසුව, ඔහුගේ බිරිඳ වඩාක්කංකුලම් හී අවුරුදු 14ක් ජීවත් වී, කිතුණුවන්ගේ විශ්වාසය වර්ධනය කිරීමේ සේවයේ යෙදුනාය.

